කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

කාර්ය පත්‍රිකාව

විෂය- ව්‍යාපාර සංඛ්‍යානය

**සංඛ්‍යාන අනුමිතිය සඳහා නියැදි මධ්‍යන්‍යයෙහි නියැදුම් ව්‍යාප්ති ගොඩනගයි.**

ශ්‍රේණිය - 13

පාඩම - 1

නිපුණතාව 7.0 - ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සංඛ්‍යාන නිමානය යොදා ගනියි.
නිපුණතා මට්ටම 7.2 – සංඛ්‍යාන අනුමිතිය සඳහා නියැදි මධ්‍යන්‍යයෙහි නියැදුම් ව්‍යාප්ති ගොඩනගයි.

1.) ආයතනයක සේවක වැටුප්වල මධ්‍යන්‍ය වැටුප රු.25,000 හා සම්මත අපගමනය රු.6,000 වන පරිදි ප්‍රමත ව්‍යාප්තියක පිහිටයි.සේවකයන් 9 දෙනෙකුගෙන් යුත් සසම්භාවී නියැදියක් තෝරා ගත්තේ නම්,

(i) නියැදි මධ්‍යන්‍යයේ නියැදුම් ව්‍යාප්තියේ මධ්‍යන්‍යය හා විචලතාව සඳහන් කරන්න.

(ii) නියැදි මධ්‍යන්‍යයන්ගේ නියැදුම් ව්‍යාප්තිය ලියා දක්වන්න.

(iii) නියැදියේ සේවකයෙකු රු.30,000ක් හෝ ඊට වැඩි වැටුපක් ලැබීමට ඇති සම්භාවිතාව කීයද?

(iv) රු.20,000ක් හෝ ඊට අඩු වැටුපක් ලැබීමට ඇති සම්භාවිතාව 10% මට්ටමක පවත්වා ගැනීමට නම් නියැදි තරම කීයක් විය යුතුද?

2.) එකලස් කිරීමේ ක්‍රියාවලියකින් සීනි පැකට් කරන අවස්ථාවක එක් පැකට්ටුවක මධ්‍යන්‍ය බර 500g විය.පැකට් 49ක නියැදියක් සැලකූ විට බරෙහි සම්මත අපගමනය 10g විය.(පැකට්වල බර ප්‍රමතව ව්‍යාප්ත වේ.)

(i) නියැදි මධ්‍යන්‍යයන්ගේ නියැදුම් ව්‍යාප්තියේ මධ්‍යන්‍යය හා විචලතාව ලියන්න.

(ii) නියැදි මධ්‍යන්‍යයන්ගේ නියැදුම් ව්‍යාප්තිය ලියා දක්වන්න.

(iii) නියැදියේ පැකට් 1ක මධ්‍යන්‍ය බර 499g ට වඩා අඩු වීමට ඇති සම්භාවිතාව සොයන්න.

(iv) නියැදියේ පැකට් 1ක මධ්‍යන්‍ය බර 495g-510g ත් අතර පැවතීමට ඇති සම්භාවිතාව සොයන්න.

(v) නියැදි තරම 100 දක්වා වැඩි කර ඇතැයි සිතන්න.

(අ) නියැදි මධ්‍යන්‍යය 499g ට වඩා අඩු වීමට ඇති සම්භාවිතාව සොයන්න.

(ආ) නියැදි මධ්‍යන්‍යය 495g ත් 510 ත් අතර පැවතීමට ඇති සම්භාවිතාව සොයන්න.

(vi) ඉහත (iii),(iv) සම්භාවිතා හා (v) කොටසින් ලැබුණු සම්භාවිතාව සසඳන්න.

(vii) නියැදි තරම 49 සිට 100 දක්වා වැඩි කරන විට සම්භාවිතාවන්හි ඇති වූ වෙනස විස්තර කරන්න.